Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

09 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 61 S I

භූගෝල විද්‍යාව I පත්‍රය | කාලය පැය දෙකයි

නම / විභාග අංකය : ..........................................................................................................

සැලකිය යුතුයි :- ● සියලුම ප්‍රශ්න වලට සපයා ඇති ඉඩ ප්‍රමාණයේ පිළිතුරු සපයන්න.
● ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

● අංක 1 - 10 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. යුරෝපය හා ආසියාව භූගෝලීය වශයෙන් එක් භූමි ස්කන්ධයක් ලෙස පිහිටා ඇත. එය හැඳින්වෙන්නේ,
(i) ඉන්දුනීසියාව (ii) යුරේසියාව (iii) මලයාසියාව (iv) ආසියාව

02. ඕබී, යෙනිසි, ලීනා යන ගංගා ගලා බසින සාගරය නිවැරදි වන්නේ,
(i) ආක්ටික් සාගරය (ii) අත්ලාන්තික් සාගරය (iii) ඉන්දියන් සාගරය (iv) පැසිපික් සාගරය

03. ආසියා මහද්වීපයට අයත් නොවන දූපත වන්නේ,
(i) පිලිපීන දූපත් (ii) තායිවාන දූපත් (iii) තස්මේනියා දූපත (iv) ඉන්දුනීසියානු දූපත

04. ආසියාවේ 2017 වන විට වැඩිම හා අඩුම ජනගහනයන් ඇති රටවල් දෙක වන්නේ,
(i) චීනය හා ඉන්දියාව (ii) චීනය හා බංගලාදේශය
(iii) ඉන්දුනීසියාව හා පකිස්ථානය (iv) චීනය හා ටිමෝරය

05. පැහැදිලි උණුසුම් ඍතුවක් හා ශීත ඍතුවක් දක්නට ලැබෙන දේශගුණ කලාපය,
(i) නිවර්තන කලාපය (ii) සෞම්‍ය කලාපය (iii) ශීත කලාපය (iv) තුන්ද්‍රා කලාපය

06. පිනිමුවා - සේබල් යන සත්ත්ව විශේෂ හා ඕක් හා ලාච් යන ශාක විශේෂ දක්නට ලැබෙන දේශගුණ වර්ගය හා වනාන්තර කලාපය වන්නේ,
(i) ශීත කලාපය - කේතුධර වනාන්තර (ii) සෞම්‍ය කලාපය - පතනශීලී වනාන්තර
(iii) නිවර්තන කලාපය - නිවර්තන වර්ෂා වනාන්තර (iv) උණුසුම් කලාපය - සැවනා වනාන්තර

07. අභ්‍යන්තර තැනිතලාවේ දැකිය හැකි සමාන්තර හෙල්වැටි වලට නිවැරදි පිළිතුර වන්නේ,
(i) රක්වාන කඳු හා බුළුතොට හෙල් (ii) නකල්ස් කඳු වැටිය
(iii) ගෝවින්ද හෙල (iv) නමුණුකුල කඳු

08. පරිසර පතන සීඝ්‍රතාවය අනුව උස මීටර් 447 ක දී නිවරදි උෂ්ණත්ව අගය වන්නේ,
(i) $11.5^0$c (ii) $15.5^0$c (iii) $30.0^0$c (iv) $24.4^0$c

09. 1 : 50,000 භූ ලක්ෂණ සිතියම්වල ස්ථාන දෙකක් අතර දුර සෙ. මී. 1 ක් නම්, භූමියේ දී දැක්වෙන නිවැරදි දුර,
(i) කි. මී. 1/2 කි (ii) කි. මී. 1 කි (iii) කි. මී. 2 කි (iv) කි. මී. 4 කි

10. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයේ සාක්ෂරතා අනුපාතය කොපමණ ද?
(i) 50% (ii) 91.8% (iii) 75% (iv) 80%

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක 11 - 15 තෙක් දී ඇති ප්‍රකාශ කියවා එය නිවැරදි නම්, 'නි' අක්ෂරය වටා ද, වැරදි නම් 'වැ" අක්ෂරය වටා ද රවුමක් අඳින්න.**

11. ටයිගා හෙවත් කේතුධර වනාන්තර පිහිටා ඇත්තේ මධ්‍යම ආසියාවේ ය. ( "නි" "වැ" )
12. මුතුරාජවෙල, බූන්දල, කලමැටිය ප්‍රධාන වගුරු බිම් වේ. ( "නි" "වැ" )
13. ජනවර්ග අනුව ශ්‍රී ලංකා යෝනක ජන සංයුතියට දෙවන ස්ථානය හිමි වේ. ( "නි" "වැ" )
14. සාගරය දෙසට නෙරා ගිය ගොඩබිම් ප්‍රදේශය තුඩුව ලෙස හඳුන්වයි. ( "නි" "වැ" )
15. ජපානයේ ශ්‍රම බලකායෙන් 26.2% නිරත වන්නේ කාර්මික අංශයේ රැකියා වලය. ( "නි" "වැ" )

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.**

16. ඩුබායි ආර්ථිකයේ පදනම වන්නේ ................................................ නිෂ්පාදනයයි.
17. ශ්‍රී ලංකාවේ මාර්තු අප්‍රේල් මාසවල ක්‍රියාත්මක වන්නේ පළමු ...................................... කාලයයි.
18. යාපන අර්ධද්වීපයේ ...................... හා ............................ ප්‍රයෝජනයට ගනිමින් කෘෂිකර්මාන්තය දියුණු කරගෙන ඇත.
19. සංවර්ධනය පිළිබඳ යුනෙස්කෝ ප්‍රකාශනය එළි දැක්වෙනුයේ ................................................ වර්ෂයේ දීය.
20. සම්පත් අධි පාරිභෝජනය, වන විනාශය පාරිසරික ................................................ හේතු වේ.

- **අංක 21 - 25 දක්වා දී ඇති ප්‍රශ්නවලට ලබා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරන්න.**

21. උස්බිම් අතර පිහිටි දිගැටි හැඩයෙන් යුත්, පහත් බිම් .................... ලෙස හැඳින්වේ.
 (ගංගානිම්නය / අතු ගංගාව / නෙරුව)
22. කිරළ, ගිංපොල්, කටු ඉකිලි .................... ශාක වේ. (කටුපඳුරු / ලඳුකැලෑ / කඩොලාන)
23. ලෝක වෙළෙඳපොළට අමු කපු සපයන ලෝකයේ ප්‍රමුඛ රටක් වන්නේ, .................... යයි.
 (පකිස්ථානය / ඉරානය / ඉන්දියාව)
24. + -- + -- + -- + -- + යන සංකේතයෙන් .................... දැක්වේ.
 (දිස්ත්‍රික්ක / පළාත්මායිම / නගරසභා මායිම)
25. ලෝකයේ පරමාණුක බලශක්ති බහුලව භාවිතා කරන රටවල් අතර .................... ඉදිරියෙන් සිටී.
 (කැනඩාව / ජපානය / මහා බ්‍රිතාන්‍ය)

- **අංක 26 - 30 ප්‍රශ්න සඳහා A, B තීරු නිවැරදිව ගැළපෙන අක්ෂර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

26. පහත සඳහන් කඳුවැටිවල උස නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

| A තීරුව | B තීරුව |
|---|---|
| එවරස්ට් | A. මීටර් 7817 |
| නන්දා දේවි | B. මීටර් 8167 |
| මකාලු | C. මීටර් 8848 |
| ධවලගිරි | D. මීටර් 8462 |

(i) CABD (ii) CADB (iii) ABCD (iv) DCBA

27. ශ්‍රී ලංකාවේ භූවිෂමතා කලාපවල භූ ලක්ෂණ නිවැරදිව ගැළපූ විට පිළිතුර වන්නේ,

| A තීරුව | B තීරුව |
|---|---|
| දොලොස්බාගේ | A. කපොල්ල |
| මහවලතැන්න | B. කඳු |
| බලන | C. ශේෂ කඳු |
| සීගිරිය | D. සානුව |

(i) ABCD (ii) BCDA (iii) CADB (iv) BDAC

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

28. ශ්‍රී ලංකාවේ ස්වභාවික වෘක්ෂලතා කලාපවල හඳුනා ගෙන ඇති ශාක විශේෂ කලාප අනුව ගැලපූ විට පිළිතුර වන්නේ,

| A තීරුව | B තීරුව |
|---|---|
| කටු ඉකිලි | A. පහතරට වියළි |
| පලු | B. කඩොලාන |
| බෙරලිය | C. කඳුකර වියළි |
| මහරත්මල් | D. කඳුකර තෙත් |

(i) BADC (ii) ABCD (iii) BCDA (iv) CADB

29. පරිසරයට අහිතකර මානුෂ ක්‍රියාකාරකම් හා එහි බලපෑම් නිවැරදිව ගැළපූ විට,

| A තීරුව | B තීරුව |
|---|---|
| ජල මූලාශ්‍ර විනාශ වීම | A. කෘෂි රසායන භාවිතය |
| ජල මාර්ග අවහිර වීම | B. යුධ අවි අත්හදා බැලීම |
| සාගර ජල දූෂණය | C. වනාන්තර විනාශ වීම |
| පාංශු හා ජල ජීවීන් විනාශ වීම | D. අක්‍රමවත් නාගරීකරණය |

(i) ABCD (ii) BCDA (iii) CDBA (iv) DBCA

30. ආසියානු කලාපයේ ආර්ථික ක්‍රියාකාරකම් වලට දායක වන වැදගත් ආයතන නිවැරදිව ගැළපූ විට පිළිතුර වන්නේ,

| A තීරුව | B තීරුව |
|---|---|
| මැද පෙරදිග ප්‍රධාන අපනයන මධ්‍යස්ථානය | A. ටොයෝටා |
| අති නවීන මෝටර් රථ නිෂ්පාදනය | B. කැෂියෝ |
| ඉලෙක්ට්‍රෝනික් හා විදුලි උපකරණ | C. ඩුබායි මෝල් (Dubi Mall) |
| ලෝකයේ විශාලතම වෙළෙඳ මධ්‍යස්ථානය | D. ජේබල් අලි වරාය |

(i) DABC (ii) ABDC (iii) CDAB (iv) BACD

## භූගෝල විද්‍යාව - II

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**


01. (අ) 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල භාවිතා වන පහත සඳහන් භෞතික ලක්ෂණ හා සංස්කෘතික ලක්ෂණ **නියමිත වර්ණ හා සංකේත** භාවිත කර ඇඳ දක්වන්න. ( මේ සඳහා වෙනත් කොළයක් භාවිතා කරන්න )

| | | | |
|---|---|---|---|
| i. | ප්‍රධාන තැපැල් කාර්යාලය | ii. | ප්‍රධාන මාර්ගය |
| iii. | බෞද්ධ සිද්ධස්ථානය | iv. | ප්‍රදීපාගාරය |
| v. | තේ වගාව | vi. | මද බැවුම |
| vii. | රක්ෂිත අභය භූමිය | viii. | වාරි මාර්ග ඇළ |
| ix. | තේ වගාව | x. | පටු දුම්රිය මාර්ගය |

(ල. 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(ආ) සපයා ඇති ලෝක ආකෘති සිතියමේ පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.




i. A, B, C අක්ෂර වලින් දැක්වෙන උතුරු ආසියාවේ විශාල තැනිතලා ප්‍රදේශයක් වන "බටහිර සයිබීරියානු තැන්න"දැක්වෙන අක්ෂරය කුමක් ද?

ii. E, F, G යන අක්ෂරවලින් දැක්වෙන පැසිපික් සාගරයට සම්බන්ධ "කහ මුහුද" දැක්වෙන්නේ කිනම් අක්ෂරයෙන් ද?


iii. K, L, M යන අක්ෂර වලින් ගංගානම් ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?

iv. H. I. J යන අක්ෂර වලින් එක්සත් අරාබි එමීර් රාජ්‍යය අයත් ඩුබායි රට පිහිටි අක්ෂරය කුමක් ද?

v. P, Q, R යන අක්ෂර වලින් දැක්වෙන 2019 වර්ෂයේ මැද භාගයේ දැඩි ලෙස ගින්නෙන් හානියට පත් වූ ඇමසන් වනාන්තරය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 05)

(ඇ) සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

i. දැදුරු ඔය
ii. යාපනය කලපුව
iii. ඩෙල්ෆ්ට් දූපත
iv. යාල වනෝද්‍යානය
v. මොනරාගල දිස්ත්‍රික්කය (ල. 05)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

02\. i. ආසියානු කලාපයේ ඉතා අඩු උෂ්ණත්වයක් හා ඉතා ඉහළ උෂ්ණත්වයක් වාර්තා වන නගර දෙක කුමක් ද? (ල. 02)

ii. ආසියානු මහද්වීපයේ දක්නට ලැබෙන පැරණි මානව ශිෂ්ටාචාර 3 ක් නම් කරන්න (ල. 03)

iii. ආසියානු මහද්වීපයේ එක් එක් දේශගුණ කලාපවල ව්‍යාප්ත ස්වාභාවික වෘක්ෂලතා ප්‍රභේද 3 ක් නම් කර ඉන් එක් වෘක්ෂලතා ප්‍රභේදයක් තුළ වැඩෙන ශාක හා සත්ත්ව විශේෂ 2 බැගින් නම් කරන්න (ල. 05)

03\. i. පකිස්ථානයේ ප්‍රධාන කෘෂිකාර්මික සෘතු දෙක සඳහන් කර, එම එක් එක් සෘතුවේ වගා කරන බෝග වර්ග 1 බැගින් ලියන්න. (ල. 02)

ii. ජපානය ආසියාවේ ප්‍රධාන කාර්මික රටක් ලෙස වැදගත් වීමට හේතු 3 ක් සඳහන් කරන්න (ල. 03)

iii. (අ) ඩුබායි ආර්ථිකයේ සේවා අංශයෙන් එරට දළ දේශීය නිෂ්පාදනයට දායක වන ප්‍රතිශතය කුමක් ද? (ල. 02)

(ආ) එම රටේ පවත්වා ගෙන යන සේවා කර්මාන්ත 3 ක් ලියා දක්වන්න. (ල. 03)

04\. i. කාලගුණය යනු කුමක් ද? (ල. 02)

ii. ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්කම් වලට බලපාන සාධක 3 ක් ලියන්න. (ල. 03)

iii. ශ්‍රී ලංකාවේ අර්ධ ශුෂ්ක කලාපයට අයත් ප්‍රදේශ 2 ක් නම් කර, එම කලාපයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 3 ක් ලියන්න (ල. 05)

05\. i. සංවර්ධනය යනු කුමක් ද? යුනෙස්කෝ ප්‍රකාශය අනුව පැහැදිලි කරන්න. (ල. 02)

ii. රටක සංවර්ධනය මැනීම සඳහා භාවිතා කරන දර්ශක 3 ක් නම් කරන්න (ල. 03)

iii. ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග 3 ක් විස්තර කරන්න (ල. 05)

06\. i. තිරසර සංවර්ධනය යනු කුමක් ද? (ල. 02)

ii. පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා කිරීමට ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියා මාර්ග ගැනීමට ඇති කර ඇති පරසර සංවිධාන 3 ක් ලියන්න (ල. 03)

iii. පාරිසරික අසංතුලනයට බලපාන මානුෂ ක්‍රියාකාරකම් 4 ක් ලියන්න. ඉන් එකකින් සිදුවන බලපෑම කෙටියෙන් විස්තර කරන්න (ල. 05)

07\. i. සිතියමක් යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න (ල. 02)

ii. ශ්‍රී ලංකාව කොටස් කර ඇති 1:50,000 පරිමාණයේ සිතියම් ගණන කොපමණ ද? (ල. 03)

iii. 1:50,000 මෙට්‍රික් සිතියමක අඩංගු වන භෞතික ලක්ෂණ 3 ක් හා සංස්කෘතික ලක්ෂණ 3 ක් ලියන්න (ල. 05)

08\. i. ශ්‍රී ලංකා ආර්ථිකය සමන්විත වී ඇති ප්‍රධාන අංශ 3 කුමක් ද? (ල. 02)

ii. ශ්‍රී ලාංකීය ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමට යටිතල පහසුකම් සංවර්ධනය කර ඇත. එයින් ප්‍රධාන තැනක් ගන්නා යටිතල පහසුකම් 3 ක් නම් කරන්න (ල. 03)

iii. කඳුකර කලාපය තුළ සංචාරක ආකර්ශනය වැඩි වීමට බලපා ඇති හේතු 4 ක් විස්තර කරන්න (ල. 05)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019

## භූගෝල විද්‍යාව- පිළිතුරු පත්‍රය

**9 ශ්‍රේණිය**

I - කොටස

| | |
|---|---|
| 01. යුරේෂියාව | 02. ආක්ටික් සාගරය |
| 03. තස්මේනියාව | 04. චීනය හා ටිමෝරය |
| 05. සෞම්‍ය කලාපය | 06. ශීත කලාපය - කේතුධර වනාන්තර |
| 07. රක්වාන හා බුළුතොට හෙල් | 08. $30.0^0$ ජ |
| 09. කිලෝමීටර් 1/2 | 10. 91.8 |
| 11. වැ | 12. නි |
| 13. වැ | 14. නි |
| 15. නි | 16. පෙට්‍රෝලියම් |
| 17. අන්තර් මෝසම් | 18. රතු පස භාරුභූගත ජලය |
| 19. 1978 | 20. පාරිසරික අසංතුලනය |
| 21. ගංගා නිම්නය | 22. කඩොලාන |
| 23. පාකිස්ථානය | 24. පළාත් මායිම |
| 25. ජපානය | 26. CADB II |
| 27. BDAC IV | 28. BADC I |
| 29. CDBA II | 30. DABC I |

II කොටස

1. ප්‍රශ්නය සිතියම් කොටසට අයත්ය.

2. I අඩුම උෂ්ණත්වය - රුසියාවේ "වර්කොයැන්ක් කුඩා නගරය"
   වැඩිම උෂ්ණත්වය - "ජකෝබාද්" නගරය
   II ඉන්දු නිම්න ශිෂ්ඨාචාර ★ හොවැන්හෝ ශිෂ්ඨාචාරය
   III නයිල් නිම්නය

| IV | ශාක | සතුන් |
|---|---|---|
| ★ නිවර්තන වර්ෂා වනාන්තර | ● මහෝගනී, කළුවර,රෝස්වුඩ් | ● වදුරා, මුවා, කටුස්සා, නරියා |
| ★ පතනශීලි වනාන්තර | ● මල්බෙරි, චෙස්නට්, ෆයින් | ● වලසා, වෘකයා, ගෝනා, මුවා |
| ★ කේතුධර වනාන්තර | ● ස්ප්‍රෲස්, ඕක්, ලාච් | ● පිනිමුවා, හිමවලසා, ( 11,12 පිටුව ) |

3. I කාරිප් - කපු, වී, මිලට්, උක්
   රාබී - තිරිඟු බාර්ලි, ඕට්ස්
   II ★ දළ ජාතික නිෂ්පාදිතය අනුව තුන්වන විශාලම ආර්ථිකය ඇති රට
   ★ 27% කර්මාන්ත අංශය හිමිකර ගැනීම
   ★ ශ්‍රම බලකායෙන් 26% ක් කාර්මික අංශයේ නියලීම.
   III 37.2% - ගුවන් ගමන් මධ්‍යස්ථාන, නිදහස් වෙළඳ වරාය, ජාත්‍යන්තර සන්නිවේදන මධ්‍යස්ථානය 21 පිටුව.

4. I කිසියම් ස්ථානයක කෙටි කාලයක් තුළ එම ස්ථානයේ පවතින වායු ගෝලීය තත්වයයි.
   II ★ ඉන්දියානු උප මහද්වීපයට ඇත්ව පිහිටීම
   ★ උන්නතාංශය
   ★ මුහුදේ සිට ඇති වෙනස් වන සුළං රටාව
   III ★ වයඹ දිග මන්නාරම - හම්බන්තොට ( 41 පිටුව )

5. I 1978 යුනෙස්කෝ ප්‍රකාශය - ( 68 පිටුව )
   II ඒක ශීර්ෂ ආදායම, ළදරු මරණ අනුපාතය, උපතේදී ආයු අපේක්ෂාව, සාක්ෂරතාව
   III 69 පිටුව ආදර්ශ කර ගන්න.

6. I වර්තමාන අවශ්‍යතා සපුරා ගනිමින් අනාගත පරපුරට ස්වකීය අවශ්‍යතා ඉටුකර ගැනීමට, අයිතිය තහවුරු කරන පරිසරය ගොඩනැගීමයි.
   II ඉඩම් භාවිතය, සැලසුම් කිරීම, වන ජීවීන් සංරක්ෂණය කිරීම, මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවීම, ජාතික වන භූමි පනත ( 81 පිටුව )
   III ★ වනාන්තර විනාශ කිරීම ★ කෘෂි රසායන භාවිතය ★ අක්‍රමවත් නාගරීකරණය ★ කැලි කසල අවිධිමත් ලෙස ඉවත දැමීම ( 79 පිටුව )

7. I අප අවට පරිසරයේ භෞතික හා සංස්කෘතික ලක්ෂණ, සම්මත සංකේත හා වර්ණ භාවිතා කර කිසියම් පරිමාණයකට අනුව පැතලි තලයක, ත්‍රිමාන/ද්විමානව නිර්මාණය කර ඇති චිත්‍රයකි.
   II කොටස් ගණන 92 යි.
   III ★ නිම්න නෙරු කඳු, ගංගා, වනාන්තර
   ★ ප්‍රවාහන ජාලය, ජනාවාස, වගාවන්, වැව්, ප්‍රධාන ආයතන ( රෝහල්, පාසල් )

8. I කෘෂිකාර්මික, කාර්මික, සේවා යන අංශ
   II ජලය, විදුලිය, මහාමාර්ග, අධිවේගී මාර්ග, සන්නිවේදන
   III සුවිශේෂී වූ භූ විෂමතාවය, කඳු, දියඇළි ගංගා, ඓතිහාසික ස්ථාන, භූමියේ වගා කටයුතු (6 ක්), පරිසර අලංකරණය, විශේෂ උද්භිද උද්‍යාන, හග්ගල, පේරාදෙණිය (62 පිටුව)

★ දී ඇති 8 වන ප්‍රශ්නය ඉවත් කර 9,8 ලෙස සලකන්න.